**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**

# ලංසු ආරාධනය

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය සඳහා මාසික කුලී ගෙවීමේ පදනම මත වසර 5ක කාලයක් සඳහා ගොඩනැගිල්ලක් සපයා ගැනීමේ ප්‍රසම්පාදනය

**කොන්ත්‍රාත් අංකය (IFB) : DIE/PRO/03/2026/45**

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය සඳහා, මාසික කුලී ගෙවීමේ පදනම මත අවම වශයෙන් වසර 5ක කාලයක් සඳහා ගොඩනැගිල්ලක් සපයා ගැනීමට යෝග්‍යතාපූර්ණ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට වැඩිමනත් විස්තර නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන), ප්‍රසම්පාදන අංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, 05 වන මහල, “සුහුරුපාය”, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල (ඇමතුම් අංක : 011-2101515) යන ස්ථානයෙන් ලබා ගත හැකිය.

   ලංසු ලේඛන ලබාගැනීම හා පරීක්ෂාව ඕනෑම වැඩ කරන දිනයකදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පහත ස්ථානයන්හිදී සිදු කළ හැකිය.

   - ප්‍රසම්පාදන අංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, 05 වන මහල, “සුහුරුපාය”, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල –

     (සරප් කවුළුවට මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කර ලංසු ලේඛන කට්ටලය ලබාගත හැකිය)

   - කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය, අංක 95, මීගමු පාර, කුරුණෑගල –

     (ලංකා බැංකුවේ බත්තරමුල්ල ශාඛාවේ ගිණුම් අංක 7041443 දරණ ආගමන විගමන පාලක ජනරාල්ගේ නිල බැංකු ගිණුම වෙත මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කර ලංසු ලේඛන කට්ටලය ලබාගත හැකිය)

3. සේවාව සැපයීම : ගිවිසුම අත්සන් කරන දිනයෙන් වහාම.

4. ලංසුකරුවන් පහත අවම සුදුසුකම් මට්ටම් සපුරාලිය යුතුය.

   **පිහිටීම :**

   - කුරුණෑගල ප්‍රධාන බස් නැවතුම්පලේ සිට ප්‍රධාන මාර්ගයක උපරිම කිලෝමීටර් දෙකක් (2km) ඇතුළත පිහිටා තිබිය යුතුය.

     පොදු ප්‍රවාහන සේවා සපයා ගැනීමට හැකි සහ මහජනතාවට පහසුවෙන් ළඟාවිය හැකි ස්ථානයක් විය යුතුය.

**පහසුකම් :**

- 60 A හෝ ඊට වැඩි තෙකලා විදුලිය තිබිය යුතුය. (වරලත් විදුලි ඉංජිනේරු සහතිකයක් තිබිය යුතුය)
- ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ ජල සැපයුමක් තිබීම හා අඛණ්ඩ ජල පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් ස්ථාපනය කර තිබිය යුතුය.
- කාර්යාලීය කාර්ය මණ්ඩලයේ මෝටර් රථ හා යතුරු පැදි නැවැත්වීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ තිබීම. [අවම වශයෙන් වර්ග අඩි 600ක (අඩි 30 X අඩි 20) ප්‍රමාණයක්]
- ආරක්ෂක නිලධාරීන්ට රැඳී සිටීමට ගොඩනැගිල්ලට යාබදව පිටතින් කුටියක් තිබීම.
- මහජනතාව සඳහා භාවිතා කිරීමට හැකි පරිදි අවම වශයෙන් වැසිකිළි දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් තිබීම.
- කාර්ය මණ්ඩලය සඳහා ගොඩනැගිල්ලේ ඇතුළත අවම වශයෙන් වැසිකිළි දෙකක් වත් තිබිය යුතුය.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා බාධක රහිත ප්‍රවේශයක් තිබීම අමතර සුදුසුකමක් වේ.
- අවම වශයෙන් වසර 5කට බදු දිය යුතුයි.
- නිරවුල් අයිතිය තහවුරු කළ යුතුය.

**5. ඉඩකඩ අවශ්‍යතාවය :**

| අංශය | විස්තරය | අවම වර්ග අඩි ප්‍රමාණය |
|---|---|---|
| ප්‍රධාන කාර්යාල පරිශ්‍රය | නිලධාරීන්ගේ රාජකාරි කටයුතු, විවේකාගාර, ලේඛනාගාර සහ රැස්වීම් ශාලා සඳහා | 4,000 |
| මහජන රැඳී සිටීමේ ප්‍රදේශය | සේවාව ලබා ගැනීමට පැමිණෙන ජනතාව සඳහා රැඳී සිටීමට ප්‍රමාණවත් ඉඩකඩ සහ වාතාශ්‍රය සහිත ප්‍රදේශය | 1,600 |

6. තාක්ෂණික ඇගයීම් කමිටුව මගින්, ගොඩනැගිල්ලේ පිහිටීම, තත්ත්වය හා අවශ්‍යතාවයට ගැළපීම යන කරුණු පිළිබඳ සෑහීමකට පත්වුවහොත් පමණක්, රජයේ තක්සේරුව හා ලංසුකරුවන් ඉදිරිපත් කර ඇති තක්සේරුව යන දෙකෙන් අඩුම මිලට අදාළව අවම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ ලිපිය (Letter of Award) නිකුත් කරනු ලැබේ. අවම ලංසුකරුට යහපත් තත්ත්වයේ ගොඩනැගිල්ලක් සැපයීමට නොහැකි නම්, කොන්ත්‍රාත්තුව පිරිනැමීම සිදු නොවේ. රජයේ තක්සේරු වාර්තා ලබාගැනීමට වියදම් වන මුදල ලංසු කරුවන්ගෙන් අයකරනු ලැබේ.

7. සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය සිංහල භාෂාවෙන්, ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවනු ලබන රු. 1,000/- ක ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් ලබා ගත හැක.

8. සම්පූර්ණ කරන ලද ලංසු, “මුල් පිටපත” (Original) හා “අනුපිටපත” (Duplicate) ලෙස පිටපත් 2කින් වෙන වෙනම කවරවල බහා මුද්‍රා, තබා, කවරයේ වම් පස ඉහළ කෙළවරේ “කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය සඳහා, මාසික කුලී ගෙවීමේ පදනම මත අවම වශයෙන් වසර 5ක කාලයක් සඳහා ගොඩනැගිල්ලක් සපයා ගැනීම” යනුවෙන් සඳහන් කර, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, 5 වන මහල, ප්‍රසම්පාදන අංශය, “සුහුරුපාය”, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල ලිපිනය වෙත, 2026 ජූලි 08 වන දින ප.ව. 02.00 ට හෝ එයට පෙර භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවීම අවසන් වීමෙන් අනතුරුව, ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ (පැමිණීමට කැමති අය), 2026 ජූලි 08 වන දින ප.ව. 02.00 ට ලංසු විවෘත කරනු ලැබේ

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,**
**05 වන මහල, “සුහුරුපාය”,**
**ශ්‍රී සුභූතිපුර පාර,**
**බත්තරමුල්ල.**